# අතුරුදහන්වූවන්ගේ පවුල් එකතුව
# காணாமற்போனாரின் குடும்ப ஒன்றியம்
# FAMILIES OF THE DISAPPEARED

FOD

No. 60, St. Anthony's Road, Periyamulla, Negombo, Sri Lanka.
Telephone: + 94 0763603729/30 Email: fodlanka@gmail.com


2021/08/09

**සභාපතිතුමා**
**අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම් සභාව**
**ගුණපාල මලලසේකර මාවත**
**කොළඹ 07.**

**සභාපතිතුමනි,**

**<u>නඩු කටයුත්තක් සම්බන්ධයෙන් චූදිතයකුට විරුද්ධව ගරු ත්‍රිපුද්ගල මහාධිකරණයේ ගොනු කොට ඇති අධිචෝදනාපත්‍රය ඉවත්කරවා ගැනීම සදහා අල්ලස් ලබා ගැනීමක් සම්බන්ධව මතුව ඇති සාධාරණ සැකයක් පදනම්ව කරනු ලබන පැමිනිල්ලයි.</u>**

**2008- 2009 කාලවකවානුව තුල තරුණ දරුවන් ඇතුලුව පුද්ගලයින් 11දෙනෙකු කප්පම් ලබා ගැනීම සදහා පැහැරගෙන ගොස් අතුරුදහන් කොට ඝාතනය කළ බවට හා ඊට අනුබලදීම සම්බන්ධයෙන් කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ B 732/09 නඩුකරය යටතේ වසර 13 ක කාලයක් මූලික විමර්ෂන පවත්වාගෙන යාමෙන් පසු අනාවරණය වන ලද සාක්ෂි හා කරුණු සම්බන්ධයෙන් සෑහීමකට පත්වීමෙන් පසු එකී අනාවරණය වන ලද කරුණු අනුව චූදිතයින් 14 දෙනෙකුට එරෙහිව එවක සිටි නීතිපතිවරයා විසින් අධිචෝදනා ගොනු කරන ලදී.මෙකී අධිචෝදනා චූදිතයින්ට ගොනු කිරීමට පෙර දීර්ගකාලයක් නීතිපතිවරයා විසින් එකී චෝදනා සහ සාක්ෂි සලකා බැලීමට ගත කොට ඇති අතරම එකී අධිචෝදනා සම්බන්ධයෙන් ගරු අගවිනිසුරුතුමාගේ බලය යටතේ හා අධීක්ෂණය යටතේ එකී චූදිතයින් 14 දෙනාට එරෙහිව විශේෂ ත්‍රිපුද්ගල මහාධිකරණයක් මෙකී නඩුව විභාග කිරීම සදහා පත් කරනු ලැබීමෙන් පසු එකී විශේෂ ත්‍රිපුද්ගල මහාධිකරණයේ මෙකී නඩු කටයුත්ත ආරම්භ කරන ලදී.මෙකී අධිචොදනාපත්‍ර 2020.01.03 වෙනි දින ගොනු කරන ලදී.එහිදී මෙම නඩුවේ 14 වන චූදිතයා ලෙස නම් කර ඇති හිටපු නාවික හමුදාපතිවරයකු වන වසන්ත කුමාර ජයදේව කරන්නාගොඩ යන අය, එකී චෝදනාපත්‍රය භාරදෙන අවස්ථාවේ එය භාරගැනීම මග හරිමින් වසන්ව සිටි නමුත්, ඔහු 2020 පැවැති නිදහස් උළෙලට එවක නීතිපතිවරයා සමීපයේ රැදී සිටිමින් නිදහස් උළෙලට සම්බන්ධ වූ ආකාරය ප්‍රසිද්ධ කරුණකි. අනතුරුව මෙම 14වන චූදිත විසින් එකී අධිචෝදනාපත්‍රයට එරෙහිව ගරු අභියාචනා අධිකරණයේ 2020.03.12 වන දින රිට් පෙත්සමක් CA writ Application 77/2020 යටතේ පවරන ලද අතර එකී පෙත්සම විභාගයට ගැනීම සදහා සාමාන්‍ය කාර්‍යපටිපාටිය අනුව එකී රිට් පෙත්සම අසා නිම කරන තෙක් 14 වන චූදිතට එරෙහිව අධිචෝදනා පත්‍රය භාරදීම වළක්වාලමින් අතුරු තහනමක් ලබා දී මෙකී නඩුව වග උත්තරකරුවන්ගේ එනම්**

නීතිපතිවරයාගේ විරෝධතා සඳහා **2020/06/25** වන දින තබන ලදී.මෙකී පෙත්සම කැඳවන ලද මුල් අවස්ථාවේ වගඋත්තරකරු ලෙස එහි නම් කොට තිබූ නීතිපතිවරයා වෙනුවෙන් පෙනී සිටි නියෝජ්‍ය සොලිස්ටර් ජනරාල් ජනාධිපති නීතිඥ සරත් ජයමාන්න මහතා ,නෙරීන් පුල්ලේ ,අවන්ති පෙරේරා ,ජ්‍යෙෂ්ඨ රජයේ නීතිඥ ජනක බණ්ඩාර, මනෝහර ජයසිංහ ,අකිල අමරතුංග යන රජයේ නීතිඥවරුන් මෙකී පෙත්සමට එරෙහිව කරුණු දක්වා ඇති අතරම මෙකි පෙත්සම ගොනු කිරීමට චූදිතට කිසිදු ආකාරයේ නීතිමය හකියාවක් නොමැති බවටද කරුණු දක්වා ඇත.එසේම මේ සම්බන්ධයෙන් දීර්ඝ විරෝධතා ප්‍රකාශයක්ද අධිකරණයට ගොනු කොට මෙකී නඩුව විමසීම සඳහා තබා ඇත.තවද මෙකී අධිචෝදනාපත්‍ර ගරු ත්‍රිපුද්ගල මහාධිකරණයේ ගොනු කිරීමෙන් පසු, **2015** ජනවාරි මස **8** වෙනි දිනෙන් ආරම්භ වී **2019** නොවම්බර් මස **16** දිනෙන් අවසන් වූ කාලසීමාව තුල සිදුවූ ඇතැයි කියන දේශපාලන පලිගැනීම් පිළිබඳව පරික්ෂා කර තොරතුරු ලබා ගැනීම සඳහා වන ජනාධිපති කොමිසමට, මෙකී චූදිත විසින් **2020/01/23** වන දින පැමිණිලි අංක **01/2020** යටතේ පැමිණිල්ලක් කරන ලදුව, එකී කොමිසම අවසන් කරනතෙක් මෙකී ත්‍රිපුද්ගල මහාධිකරණ නඩුව නවත්වන ලෙසට ඉල්ලීමක් එකී කොමිසම හරහා සිදු කළද එවක නීතිපතිවරයා නියෝජනය කරමින් සොලිස්ටර් ජනරාල් ජනාධිපති නීතිඥ සරත් ජයමාන්න මහතා ,රජයේ ජ්‍යෙෂ්ඨ නීතිඥ ජනක බන්ඩාර මහතා විසින්, එකී කොමිසම මගින් ත්‍රිපුද්ගල විශේෂ මහාධිකරණයක් බැඳී නොසිටින බව දැනුම් දීමෙන් පසු, අධිකරණය නඩු කටයුතු ආරම්භ කිරීමට නියෝග කරන ලදී.එවක නීතිපතිවරයා වූ දප්පුල ලිවේරා මහතා සමස්තයක් ලෙසට මෙකී දේශපාලන පලිගැනීම් පිළිබඳව ජනාධිපති කොමිසම මත කිසිදු නඩුකරයක් නොනවත්වන බවට එකල එකී කොමිසමට ලිඛිතව දැනුම් දීමද සිදු කරන ලදී.මෙකී **B 732/09** දරන නඩුකරයේ මුල් විමර්ශන පවතින අවස්ථාවේ, මෙකී නඩු ගොනුව භාරව සිටි රජයේ නීතිඥවරයා වූයේ රජයේ ජ්‍යෙෂ්ඨ නීතිඥ ජනක බන්ඩාර මහතා වන අතරම ,මෙකී නඩුවට අදාල අධිචෝදනා ගොනු කරන අවස්ථාවේ මෙකී නඩුගොනුව සම්බන්ධයෙන් කටයුතු කරන ලද්දේද ඔහුමය. එසේම ඉහත චූදිතගේ රිට් පෙත්සම සම්බන්ධයෙන් විරෝධතා ඉදිරිපත් කරන ලද්දේද, පසුව ගරු මහාධිකරණයේ ඉහත අවස්ථාවලදී පැමිණිල්ල වෙනුවෙන් පෙනී සිටියේද ඔහුමය.ඉහත අභියාචනා අධිකරණයේ **14** වන චූදිත වන වසන්ත කරන්නාගොඩ විසින් පවරන ලද පෙත්සමට විරෝධය දක්වමින් අගතියටපත් වින්දිත පාර්ශවයේ දෙමාපියන් විසින් එකී නඩුකරයට අතුරු මැදිහත් පාර්ශවයක් ලෙස **2020/10/13** වන දින ඇතුලත් වූ අතර ගරු අභියාචනා අධිකරණය විසින් එකී මැදිහත්වීම පිළිගෙන ඇත.එකී රිට් පෙත්සම සලකා බැලීම සඳහා **2021/08/30** වන දිනට නියම කරනු ලැබුවේ එකී **CA(writ ) application 77/2020** නඩුව **2021/07/27** වන දින කැඳවීමෙන් පසුය.එකී දිනයේ **14** වන චූදිත සම්බන්ධයෙන් වන අධිචෝදනාපත්‍ර ඉවත් කර ගැනීමක් සම්බන්ධයෙන් කිසිදු ඉල්ලීමක් නීතිපතිවරයා විසින් අධිකරණයට සිදු කලේ නැත. එසේම ප්‍රධාන නඩුකරය වන ත්‍රිපුද්ගල විශේෂ මහාධිකරණ නඩුකරය **HC (TAB) 1448/2020** නඩුකරය **2021/07/19** වන දින කැඳවූ අවස්ථාවේ හෝ එවැනි ස්ථාවරයක් අධිකරණයට නීතිපතිවරයා විසින් ඉදිරිපත් කලේ නැත.එසේම ඉහත කී රජයේ නීතිඥවරයා වන ජනක බණ්ඩාර ත්‍රිපුද්ගල මහාධිකරණයේ පැමිණිල්ල වෙනුවෙන් පෙනී සිටන නීතිඥවරයා වුවත්, ඔහු පසුගිය කාල වකවානුව තුල කිසිදු උනන්දුවකින් ඉහත නඩුකරයට සහභාගී වීම සිදු කලේ නැත. අවස්ථා ගණනාවකදීම ඔහු වෙනුවට කනිෂ්ඨ නීතිඥවරයකු හෝ නඩුකරය ගැන කිසිවක් නොදන්නා අයෙකු අධිකරණයට එවා තිබුණි.රජයේ නීතිඥවරයාගෙන් අසන ප්‍රශ්නවලට පිළිතුරු දෙන්නේද චූදිතයින් වෙනුවෙන් පෙනී සිටින නීතිඥවරු විසිනි.මෙවැනි තත්වයක් මෙම රජයේ නීතිඥවරයා

විසින් ඇතිකරන ලද්දේ මෙකී නඩුව ඉතාම බරපතල හා මුලු ලෝකයකම අවධානය පවතින වින්දිත අපට යුක්තිය ඉෂ්ඨකර ගැනීමට තිබෙන එකම අවස්ථාව මෙය බව නොදැන නොවන බව අප විශ්වාස කරමු.මොහුගේ ආසන්නතම ක්‍රියා කලාපය අපට දැඩි අගතියක් හා සැකයක් මතු කරන්නේ වුවද අප එය අවස්ථා ගණනාවකදී විද දරා ගෙන සිටියේ අප වෙනුවෙන් මහාධිකරණයක පෙනී සිටීමින් නඩුව මෙහෙයවිය හැක්කේ ඔවුන්ට පමණක් වන නිසාය. එහෙත් **2021/08/04** වන දින නඩුවට කිසිදු ආකාරයක උනන්දුවක් නොතිබු ඉහත රජයේ නීතිඥවරයා **2021/9/22** කල් තබා තිබු ත්‍රිපුද්ගල විශේෂ මහාධිකරණයේ නඩුකරය මෝෂමක් මගින් කැඳවා අධිකරණයට දැනුම් දී ඇත්තේ ඉහත **14** වන චූදිත සම්බන්ධයෙන් අධිචෝදනා පත්‍රය ඉල්ලා අස් කරගන්නා බවයි.එහෙත් මේ වනවිටත් ඒ සම්බන්ධයෙන් අභියාචනා අධිකරණයේ රිට් පෙත්සමක් පවතින බැවින්, එදින ගරු ත්‍රිපුද්ගල මහාධිකරණ විනිසුරුවරුන් විසින් එකී ඉල්ලීම පිළිගෙන නැති අතර, එය අභියාචනා අධිකරණයෙන් විසදාගෙන සෙසු චූදිතයින්ද ඉදිරියේ මේ වනවිටත් නියම කර ඇති **2021/09/22** වන දිනට සිදු කරන ලෙස නියම කර ඇත.තවද මොහු ඒ අවස්ථාවේ දැනුම් දී ඇත්තේ අභියාචනා අධිකරණයට එකී **14** වන චූදිතගේ අධිචෝදනා පත්‍රය ඉවත් කරගන්නා බව **2021/08/30** වන දින දැනුම් දෙන බවයි.මේ ආකාරයෙන් ඉතා හදිසි වුවමනාවක් ඇතිවීම හා ක්‍රියාත්මක වීම තුලම මෙම රජයේ නීතිඥවරයා වන ජනක බංඩාර මහතා සහ නව නීතිපතිවරයා වන සංජය රාජරත්නම් මහතා කිසියම් ආකාරයකට **14** වන චූදිතයාගෙන් වරප්‍රසාදයක් හෝ අල්ලස් පනතේ ප්‍රකාරව කිසියම් අල්ලසක් හෝ ත්‍යාගයක් හෝ දීමනාවක් හෝ වෙනයම් වරප්‍රසාදයක් ලබා ගැනීම මගින් සිදු කර ඇති බවට සාධාරණ සැකයක් ඇති වන බව අපි කියා සිටිමු. එසේම මෙම රජයේ නීතිඥවරයාට එරෙහිව දේශපාලන පළිගැනීම් පිළිබඳව සොයා බැලීමේ කොමිසම මගින් ඇවන්ගාඩ් පැමිණිල්ලට අදාලව සිදු වූවා යැයි කියන කිසියම් ක්‍රියාවක් සම්බන්ධයෙන් අල්ලස් හෝ දූෂණ කොමිසම මගින් නඩු පැවරීමට නිර්දේශ කිරීමට එරෙහිව, මොහු විසින් ගරු ඉහළ අධිකරණයේ පෙත්සමක් ගොනු කිරීම සම්බන්ධයෙන් නඩුකරය **2021/08/03** වන දින සිදු කළ අතර, ඔහු වෙනුවෙන් එදින අධිකරණයේ පෙනී සිට ඇත්තේ ජනාධිපති නීතිඥ රොමේෂ් ද සිල්වා මහතායි.රොමේෂ් ද සිල්වා මහතා යනු **14** වන සැකකරු වෙනුවෙන් ඉහත අභියාචනා අධිකරණයේ පෙනී සිටින නීතිඥවරයා වන අතරම, මුල්ම අවස්ථාවේ **14** වන සැකකරු අණාවරණය වු කරුණු මත අත්අඩංගුවට ගනු ලැබීමට ගරු මහේස්ත්‍රාත්තුමා නියෝග කළ අවස්ථාවේ, **14** වන සැකකරුවන වසන්ත කරන්නාගොඩ සැගවී සිට පසුව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත මුලික අයිතිවාසිකම් නඩුකරයක් පවරනු ලැබු අවස්ථාවේ, එකී නඩුවේදී වින්දිත පාර්ශවය වෙනුවෙන් මැදිහත් පාර්ශවයක් ලෙස ඇතුලත්ව පෙනී සිටින ලද අවස්ථාවේ වින්දිත පාර්ශවයේ නීතිඥවරයාට ගරු අධිකරණයේ වින්දිතයින් වෙනුවෙන් කරුණු දැක්වීමට බාධා කරමින් අපහාසාත්මක ලෙස කටයුතු කරන ලද නීතිඥවරයාය.

මෙවැනි ඉතාම වගකිවයුතු හා ආන්දෝලාත්මක මනුෂ්‍ය ඝාතන සම්බන්ධයෙන් වන නඩුකරයක රජයේ නීතිඥවරයා ලෙස පෙනී සිටින රජයේ නීතිඥ ජනක බංඩාර මහතා, මේ ආකාරයෙන් පවතින නඩුවක, එකී නඩුවේම **14** වන චූදිතයා වෙනුවෙන් පෙනී සිටින නීතිඥවරයා තම නඩුවට යොදා ගනිමින්, ඒ ආසන්න දිනයක වසර **13** කට අධික කාලයක් විමර්ෂණ සිදු කොට අනාවරණය කරගනු ලැබු සාක්ෂි හා කරුණු මත අධිචෝදනා ගොනු කිරීමෙන් දීර්ග කාලයකට පසු, ඒ සම්බන්ධයෙන් නීති කටයුත්තක් අවසන් වීමටත් පෙර මේ ආකාරයෙන් කඩිනමින් හදිස්සියේ **14** වන චූදිතගේ චෝදනාපත්‍රය ඉවත් කර ගැනීමට කටයුතු කරන බව දැන්වීම හා ඒ අනුව කටයුතු

කිරීම තුලම කිසියම් වරප්‍රසාදයක් හෝ ලාභයක් බලාපොරොත්තුවෙන් කළ ක්‍රියාවක් බවට සාධාරණ සැකයක් මතු වේ.


තවද පූර්ව නීතිපතිවරයා යටතේ මෙකී අධිචෝදනාපත්‍ර සම්බන්ධයෙන් නිතිපති දෙපාර්තමේන්තුව දැරූ ස්ථාවරය, නව නීතිපතිවරයා වන සංජය රාජරත්න මහතා ධූරය භාරගැනීමෙන් පසු හදිස්සියේ කලබලෙන් වෙනස් කිරීමද, ඒ සම්බන්ධයෙන් නඩු කටයුත්තක් පවතින අවස්ථාවේදී වින්දිත පාර්ශවයද ඊට විරුද්ධව මැදිහත් පාර්ශවය ලෙස ඇතුලත්ව සිටියදී ඒ සම්බන්ධයෙන් කිසිදු කරුණු සලකා බැලීමකින් තොරව, මෙසේ අධිචෝදනා පත්‍රය ඉවත් කර ගැනීමට කටයුතු කිරීමම දූෂිත ක්‍රියාවකි. තවද රජයේ නිලධාරීන් ලෙස අයුතු ලාභයක් හා වරප්‍රසාදයක් වෙනුවෙන් කටයුතු කිරීමකි.

එසේම මේ සිද්ධියට අදාළ නඩුකරයට මුල් වන්නේ මුදල් හෝ වෙනයම් භෞතික සම්පතක් නොව, මිනිසුන් ඝාතනයකට අදාළවය.මෙහිදී  වින්දිතභාවයට පත්වී සිටින්නේ එම අතුරුදහන් කිරීමට ලක්වූ දරුවන්ගේ ජීවිත වෙනුවෙන්  වසර 13 ක කාලයක් යුක්තිය අපේක්ෂාවෙන් අධිකරණය බලාපොරොත්තුවෙන් සිටි දෙමාපියන්ය.අතුරුදහන් වූ වින්දිතයින්  ය. නීතිපති දෙපාර්තමේන්තුවේ ඉහත නීතිපතිවරයා හා  වගකිවයුතු රජයේ ඉහත නම් සදහන් කොට ඇති රජයේ නීතිඥවරයා, අයුතු විෂමාචාරී බලපෑමක් හෝ වරප්‍රසාදයක් 14 වන වූදිතයා හෝ හා ඔහු නියෝජනය කරනු ලබන නීතිඥවරයාගේ හෝ කිසියම් දේශපාලන බලාධිකාරියක වරප්‍රසාදයක් මත, වසන්ත කරන්නාගොඩ මහතාට විරුද්ධව ඇති අධි චෝදනා ඉවත් කර ගැනීමට නීති විරෝධී උත්සහයක යෙදෙන බවට අපි චෝදනා කරමු.

එබැවින් ඉහත රජයේ නීතිඥවරයා වන ජනක බණ්ඩාර මහතා සහ නීතිපතිවරයා වන සංජය රාජරත්නම් මහතා විසින්, 14 වන වූදිත වන වසන්ත කරන්නාගොඩ යන අයට එරෙහිව ගොනු කොට ඇති  අධිචෝදනා පත්‍රය ඉවත් කර ගැනීමට කටයුතු කිරීම මගින්, ඉහත නඩුවේ වින්දිත පාර්ශවයට අයුක්තියක් කිරීම සඳහා සහ 14 වන වූදිත වෙනුවෙන් ක්‍රියා කර තිබීම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන පනත යටතේ සාපරාධී වරදක්  බැවින් ඒ සම්බන්ධයෙන් වහාම විමර්ශනයක් කොට නීතිමය පියවර ගන්නා ලෙසත් වින්දිතයින්ට යුක්තිය ඉටු කිරීමට කටයුතු කරන ලෙසත්  කාරුණිකව ගෞරවයෙන් ඉල්ලා සිටිමු.

ස්තුතියි ,

මීට,විශ්වාසි,



කේ. ජේ. බ්‍රිටෝ ප්‍රනාන්දු

සභාපති